(5)

Article 12(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2018-01-30 |

පැමිණිලිකාරිය : පී.එච්.එම්.ප්‍රියන්ති මිය.
සඳුන් උයන. ආරච්චි කන්ද.
හික්කඩුව.

වගඋත්තරකරුවන් : විදුහල්පති.
ගා/ධර්මාශෝක විද්‍යාලය.
අම්බලන්ගොඩ.

<u>පැමිණිලි අංකය : **HRC/494/14**</u>

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාරිය විසින් 2014.01.27 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින්. තම දරුවා වන එම්.ජ්. සුරත් මන්දරා දරුවා 2014 වර්ෂයේ වගඋත්තරකාර විද්‍යාලයේ පළමු වසරට ඇතුලත් කිරීමට අයදුම් කර සම්මුඛ පරීක්ෂණයට සහ අභියාචනා පරීක්ෂණය සඳහා සහභාගී වූවද තමාට හිමිවිය යුතු ලකුණු ලබා නොදීම තුලින් අසාධාරණ ලෙස තම දරුවාට පාසලට ඇතුලත් වීමට තිබූ අවස්ථාව අහිමි කර ඇති බවට සඳහන් කර ඇත. එසේම පැමිණිලිකාරියට වඩා අඩු සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් ආදිශිෂ්‍ය පදනම මත ලකුණු ලබා ඇතුලත් වීමේ ලේඛනයට ඇතුලත් කොට ඇති බවද තමා විසින් පාසලට හා ආදි ශිෂ්‍ය සංගමයට කරන ලද කැප කිරීම් අවතක්සේරුවට ලක් කර ඇති බවද පැමිණිලිකාරිය විසින් සිය පැමිණිල්ල මගින් දන්වා ඇත. ඒ අනුව පැමිණිලිකාරිය සතු ලේඛන අනුව පැමිණිලිකාරියට තවත් ලකුණු 2.5ක් එකතු විය යුතු බවද දක්වා ඇත.

සිදු වූ අසාධාරණය සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා වගඋත්තරකාර විද්‍යාලයේ පළමු වසරට තම දරුවා ඇතුලත් කර ගැනීම මෙම පැමිණිල්ල මගින් අපේක්ෂා කරන බවද දන්වා ඇත.




| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | **14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04.**<br>14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.<br>14, R. A. De Mel Mawatha, Colombo - 04. | සභාපති<br>தவிசாளர்<br>Chairperson | 011-2505451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2505541/74 | ඊමේල්<br>மின்னஞ்சல்<br>e-mail | sechrc@sltnet.lk |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94 -11- 2505580/81/82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2505521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 011-2505575<br>1996 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම :-

උක්ත අංක දරණ පැමිණිල්ල සම්බන්ධයෙන් දෙපාර්ශවයේ සහභාගිත්වයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී පරීක්ෂණ කටයුතු පවත්වා ඇති අතර, වගඋත්තරකරු වෙනුවෙන් උපගුරු ඩබ්.ටී.ආර්. පුෂ්පකුමාර මහතා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ කරුණු දක්වා ඇත. පැමිණිලිකාරිය ආදි ශිෂ්‍ය ගණය යටතේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට ලකුණු 53.25ක් ලබා ගෙන ඇති බවත්, පාසලට ළමුන් ඇතුළත් කර ගැනීමේ කඩඉම් ලකුණු සීමාව 53.33ක් වන බවත් සඳහන් කර ඇත. ඒ අනුව එම ලකුණු මට්ටම කරා ප්‍රවිශ්ඨ වීමට අසමත්ව ඇති බැවින්, පැමිණිලිකාරියගේ දරුවාට පාසලට ඇතුළත් වීමට තිබූ අවස්ථාව අහිමි වී ඇති බවත්, වගඋත්තරකාර පාර්ශවය විසින් දන්වා ඇත.

2015-07-20 වන දිනැති සිය වාර්තාව මගින් වගඋත්තරකරු වැඩිදුරටත් කරුණු දක්වමින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකාරියගේ දරුවාට තවත් ලකුණු 0.08ක ප්‍රමාණයක් අඩුවීම මත ඉවත් වී ඇති බව නිරීක්ෂණය වන බවයි. පැමිණිලිකාරිය දීර්ඝ කාලීනව පාසලේ ආදි ශිෂ්‍ය සංගමයේ ක්‍රියාකාරී සාමාජිකාවක සහ පාසලේ කටයුතු වලදී සහය දක්වන තැනැත්තියක වශයෙන් හඳුනාගෙන ඇති බවද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශය සහ අධ්‍යාපන ලේකම්වරයාගේ අනුමැතියට යටත්ව මෙම පැමිණිල්ල සමථයකට පත් කර ගැනීමට එකඟතාවය පළ කරන බවද වේ.

නිරීක්ෂණ :-

ඉහත පරිදි ඉදිරිපත්ව ඇති සමස්ථ කරුණු අනුව ආදි ශිෂ්‍ය ගණය යටතේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින ළදුව සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 53.25ක ප්‍රමාණයක් ලබා ගෙන ඇති බවත්, පාසලට ඇතුළත් වීමේ කඩඉම් ලකුණු සීමාව ලකුණු 53.33 ක් වන බවත්, ලකුණු දශම 0.08ක් අඩුවීම හේතුවෙන් දරුවාගේ අවස්ථාව අහිමි වී ඇති බවත්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ නිරීක්ෂණය වීම මත හා පැමිණිලිකාරිය දීර්ඝ කාලීනව පාසලේ ආදි ශිෂ්‍ය සංගමයේ ක්‍රියාකාරී සාමාජිකාව සහ පාසලේ කටයුතු වලදී සහය දක්වන බැවින්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සහ අධ්‍යාපන ලේකම්වරයාගේ අනුමැතියට යටත්ව මෙම පැමිණිල්ල සමථයකට පත් කර ගැනීමට වගඋත්තරකරු සිය එකඟතාවය ප්‍රකාශ කර ඇති බැවින් 2015.09.22 දිනැතිව මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශ ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2015.10.22 දිනට පෙර අදාල නිර්දේශය ක්‍රියාත්මක කර කොමිෂන් සභාව වෙත වාර්තා කරන ලෙසට වගඋත්තර පාර්ශවය වෙත දන්වා ඇත. නමුත් අදාල නිර්දේශය ක්‍රියාත්මක නොවූ බවට පැමිණිලිකරු විසින් සිය 2015.10.22 දිනැති ලිපිය මගින් කොමිෂන් සභාව වෙත දන්වා ඇති අතර, අධ්‍යාපන අමාත්‍යංශයේ ජාතික පාසල් අධ්‍යක්ෂකගේ 2015.11.03 දිනැති ලිපිය මගින්

අදාල නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් නොවන බවට කොමිෂන් සභාව වෙත දන්වා ඇත.

ඒ අනුව, 2016.02.19 දින සහ 2017 වර්ෂයේ අවස්ථා තුනකදී එනම්, 2017-07-31, 2017-10-02 සහ 2017-10-27 කොමිෂන් සභාවට පැමිණෙන ලෙස දන්වා ඇතත්, වගඋත්තරකාර පාර්ශවයන්ගේ නොපැමිණීම හා නිසි කරුණු දැක්වීමක් නොකිරීම හේතුවෙන් පැමිණිලිකාරියගේ දරුවා මේ වන තෙක්ම පාසලට ඇතුලත් කර ගැනීමේ අවස්ථාව අහිමි වී ඇති බවද කොමිෂන් සභාවේ අවධානයට ලක්කොට ඇත.

අනතුරුව 2018.01.12 වන දින පැමිණිල්ලට අදාල පරීක්ෂණය නියම කොට ඇති අතර එදින පාර්ශවයන් විසින් ඉදිරිපත් කර ඇති කරුණු අනුව පැමිණිලිකාරියගේ චිත්‍ර සහතිකය වෙනුවෙන් ලකුණු 02ක් ලැබිය යුතු වුවත්, එම ලකුණු 02ක ප්‍රමාණය ලබා නොදීම හේතුවෙන් පැමිණිලිකාරියට හිමි එම ලකුණු 02 ක ප්‍රමාණයද අහිමි වී ඇති බවත්, ඒ අනුව එම ලකුණු 2 ක ප්‍රමාණයද පැමිණිලිකාරියගේ දරුවා හට ලැබිය යුතු අතර ඒ අනුව පැමිණිලිකාරියගේ මුළු ලකුණු ප්‍රමාණය 55.25ක් වන බවත් අනාවරණය වී ඇත. මේ තත්වය එදින පැමිණි පාසලේ විදුහල්පතිතුමා වන වෙත්තමුණි මහතා විමර්ශනයේදී පෙන්වා දී ඇත.

ඒ අනුව පැමිණිලිකාරියගේ දරුවා පාසලට ඇතුලත් වීමේ කඩඉම් ලකුණු සීමාව ඉක්මවා එනම්, වැඩිපුර ලකුණු 1.92ක් ලබා ගෙන ඇති බවත්, එම ලකුණු ප්‍රමාණය පැමිණිලිකාරිය වෙත ලබා නොදීම හේතුවෙන් පැමිණිලිකාරියගේ දරුවා හට පාසැලට ඇතුලත් වීමේ අවස්ථාව අහිමි වී ඇති බවත් කොමිෂන් සභාව හමුවේ වැඩිදුරටත් අනාවරණය වී ඇත. එසේම චිත්‍ර සහතිකය සඳහා පැමිණිලිකාරිය වෙත ලකුණු 02 ක් හිමි විය යුතු වුවද එම ලකුණු ප්‍රමාණය ලබා දී නොමැති බවට වගඋත්තර පාර්ශවය විසින්ද පිළිගෙන ඇති බවද නිරීක්ෂණය වේ. ඒ තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලි පාර්ශවයේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට පරීක්ෂණයෙන් අනතුරුව තිරණය කරනු ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව මෙම පැමිණිලිකාරියගේ දරුවා කඩිනමින් 2018 වර්ෂයේ වගඋත්තරකාර විද්‍යාලයේ 05 වන ශ්‍රේණියට ඇතුලත් කර ගන්නා ලෙස වගඋත්තරකාර විද්‍යාලයට නිර්දේශ කර සිටිනු ලැබේ.

2018.02.08 දිනට පෙර මෙම නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරු වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදුනොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- ලේකම්,
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/